# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1921/59 – 2015 ජූලි 03 වැනි සිකුරාදා – 2015.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම්යූඑල්/83 වෙම්මලෙයි නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නයාරු නමැති ගමේ පිහිටි කිලිනොච්චි දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එම්යු/එම්එල්එල්/2014/284 හා 2014.09.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.7455ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – නයාරුකානි – ප්‍රමාණය: හෙක්. 1.7455**

උතුරට: නයාරුකානි විවෘත මුඩුබිම සහ වෙරළ රක්ෂිතය; නැගෙනහිරට: වෙරළ රක්ෂිතය සහ නයාරු කළපුව; දකුණට: නයාරු කළපුව සහ නයාරුකානි පහත්බිම් සහිත ප්‍රදේශය; බටහිරට: නයාරුකානි පහත්බිම් සහිත කැලෑ ප්‍රදේශය, අඩිපාර සහ නයාරුකානි විවෘත මුඩුබිම්.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/ඩී/216.
2015 ජුනි මස 23 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 832

1A – G 021821 – 22 (2015/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.